LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය

# නව නීති සහ විධායක තීරණ පිළිබඳ යාවත්කාලීන කිරීම

# - 2026 ජූලි -

2026 අගෝස්තු 15

LAW TRACKER

# නව නීති සහ විධායක තීරණ - 2026 ජූලි

*2026 අගෝස්තු 15*

## ශ්‍රී ලංකාවේ නීති සම්පාදන ක්‍රියාවලිය




## I. සහතිකය සටහන් කරන ලද පනත්

- **2026 අංක 13 දරන සමථකරණ (සිවිල් සහ වාණිජ ආරවුල්) පනත** (2026 ජූනි 30 වෙනි දින සහතිකය සටහන් කරන ලදී) - මෙමගින් සිවිල් සහ වාණිජ ආරවුල් සඳහා ස්වේච්ඡාවෙන් ආරවුල් විසඳා ගැනීමේ යාන්ත්‍රණයක් ලෙස සමථකරණය සඳහා ව්‍යවස්ථාපිත රාමුවක් ස්ථාපනය කරයි. සමථයකට පත්කර, අත්සන් කරන ලද සමථකරණ ගිවිසුම් නීත්‍යානුකූලව බැඳී සිටින ගිවිසුම් ලෙස පිළිගනියි. අධිකරණවලට ස්වකීය අභිමතය පරිදි විභාග වෙමින් පවතින නඩු සමථකරණය සඳහා යොමු කිරීමට අවස්ථාව සලසා දෙයි.
- **2026 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත** (2026 ජූලි 3 වෙනි දින සහතිකය සටහන් කරන ලදී) - මෙමගින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කරයි. එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි විය යුතු වීමේ සීමාව වර්ෂයකට රු.මි. 60 ක මට්ටමෙහි තබා ගනියි. විදේශීය ඩිජිටල් සේවා සපයන්නන් ශ්‍රී ලාංකික ගනුදෙනුකරුවන්ට සපයන සේවා මාස දොළහකට රු.මි. 60 ක් හෝ කාර්තුවකට රු.මි. 15 ක් ඉක්මවන්නේ නම් එවැනි විදේශීය ඩිජිටල් සේවා සපයන්නන් එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි විය යුතු බවට නියම කරයි. ඉන්වොයිසි කිරීම සම්බන්ධ වඩාත් දැඩි නියමයන්, ආදාන බදු ණය සම්බන්ධ සංශෝධිත නීති, බදු කාල පරිච්ඡේද පිළිබඳ යාවත්කාලීන කරන ලද නිර්වචන සහ අනුකූල නොවීම සඳහා සංශෝධිත දණ්ඩන හඳුන්වා දෙයි.
- **2026 අංක 15 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත** (2026 ජූලි 21 වෙනි දින සහතිකය සටහන් කරන ලදී) - මෙමගින් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කරයි. බලපත්‍ර නිකුත් කිරීමේ සහ අවලංගු කිරීමේ බලතල සහිතව උපායමාර්ගික පාරිසරික ඇගයීම්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, නිෂ්පාදකගේ විස්තීර්ණ වගකීම, උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය, රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සහ දූෂක මත පදනම් වූ අපජල බැහැර කිරීමේ ගාස්තු නියම කිරීම සඳහා බලතල ලැබෙන පරිදි මධ්‍යම පරිසර අධිකාරියේ බලතල පුළුල් කරයි. පාරිසරික බලපෑම් ඇගයීම් සම්බන්ධ වැරදි සඳහා රු.මි. 15 දක්වා දඩ මුදල් සහ වසර තුනක් දක්වා සිර දඬුවම් දක්වා නියම කළ හැකි පරිදි දඬුවම් ඉහළ නංවයි, ඇතැම් වැරදි සංජානනීය වැරදි කරයි, පරිසරය ප්‍රතිසංස්කරණය කරන ලෙස නියෝග කිරීම සඳහා අධිකරණවලට බලය පවරයි, සහ සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට සහ නිලධාරීන්ට පුද්ගලික වගකීම හඳුන්වා දෙයි.

## II. පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පනත් කෙටුම්පත්

- **2026 අංක 49 දරන ශ්‍රී ලංකා කැල්වරි දේවස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත**, (2026 ජූලි 9 වෙනි දින සභාගත කරන ලදී) - මෙමගින් මෙම දේවස්ථානය සමිතියක් ලෙස නොව, සමාගමක් ලෙස ප්‍රතිව්‍යුහගත කරමින් 'සීමාසහිත ශ්‍රී ලංකා කැල්වරි දේවස්ථානය' ලෙස නැවත නම් කරයි. මෙම ආයතනයට ශ්‍රී ලංකාවෙන් පිටත සිට ලැබෙන සියලුම අරමුදල් සහ තෑගි ලබා ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ලිඛිත අනුමැතිය ලබාගත යුතු බවට නියම කරයි. මූල්‍ය වාර්තා පවත්වා ගැනීම, වාර්ෂික ස්වාධීන විගණන සිදු කිරීම සහ විගණනය කරන ලද ගිණුම් සහිත වාර්ෂික වාර්තාවක් රජයට ඉදිරිපත් කිරීම අනිවාර්ය කරයි.

## III. ගැසට් පත්‍රයේ පළකරන ලද පනත් කෙටුම්පත්

- **2026 අංක 48 දරන සත්ව සුභසාධන පනත් කෙටුම්පත** (2026 ජූලි 20 වෙනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී) - මෙමගින් සත්ව සුභසාධනය සහ සතුන්ට කෲර ලෙස සැලකීම වැළැක්වීම සඳහා විධිවිධාන සලසන අතර, සතුන්ට කෲර ලෙස සැලකීම වැළැක්වීමේ ආඥා පනත (475 වන අධිකරය වූ) අහෝසි කරයි. සතුන්ට පහර දීම, සතුන්ගෙන් අධික ලෙස වැඩ ගැනීම, සතුන්ට වස දීම, සතුන් අතහැර දැමීම, සතුන් නීති විරෝධී ලෙස ඝාතනය කිරීම, සතුන් ඇල්ලීම සඳහා උගුල් භාවිතා කිරීම, සහ දඩයම් කිරීම සහ සටන්වල යෙදවීම වැනි තහනම් ක්‍රියා මගින් සතුන්ට කෲර ලෙස සැලකීම සම්බන්ධ වැරදි ස්ථාපනය කරයි. සතුන් ප්‍රවාහනය කිරීම, පරීක්ෂණ සඳහා යොදා ගැනීම සහ සුරතල් සත්ව සාප්පු සඳහා බලපත්‍ර ලබාදීම නියාමනය කරයි. සත්ව සුභසාධන උපදේශක කමිටුවක් නිර්මාණය කරන අතර, රජයේ පශු වෛද්‍යවරුන් විමර්ශනය කිරීමේ සහ බලාත්මක කිරීමේ බලතල සහිත 'සත්ව සුභසාධන නිලධාරීන්' ලෙස නම් කරයි. වඩාත්ම බරපතල වැරදි සඳහා රු. 500,000 දක්වා වන දඩ මුදල් හෝ වසර හතරක් දක්වා වන සිර දඬුවම් නියම කරනු ලැබේ.

- **2026 අංක 51 දරන දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත** (2026 ජූලි 27 වෙනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී) - මෙමගින් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සංශෝධනය කරයි. කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පළාත් රාජ්‍ය සේවය සහ පොලිස් නිලධාරීන් දක්වා පුළුල් කරයි. මහාධිකරණයේ සහ මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනුකරන ලද චෝදනා හෝ අධිචෝදනා පත්‍ර ඉල්ලා අස්කර ගැනීමට ඉඩ සලසන අතර, සම්පූර්ණ හෙළිදරව් කිරීම් සිදුකරන අපරාධ සහායකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් වැළකී සිටීමට අවසර දෙයි. ව්‍යවස්ථාපිත ආයතනවල කාර්ය මණ්ඩලය, විශාල වෘත්තීය සමිතිවල විධායක නිලධාරීන් සහ මාධ්‍ය සමාගම්වල හිමිකරුවන් සහ අධ්‍යක්ෂවරුන් ආවරණය කිරීම පිණිස අනිවාර්යයෙන් වත්කම් ප්‍රකාශයට පත්කළ යුතු වීමේ බැඳීම් පුළුල් කරයි. ප්‍රකාශකගේ පෞද්ගලිකත්වය සහ බැඳියා පිළිගැටුම් විමර්ශනය කිරීම ශක්තිමත් කරයි. අදාළ වැරදි සංඥෙය සහ ඇප ලබා දිය නොහැකි වැරදි බවට පත් කරයි; ඉහළ වටිනාකමක් සහිත වැරදි සම්බන්ධ සුවිශේෂී මහාධිකරණ නඩු සඳහා ඇප ලබා දීම සීමා කරයි. දූෂිත ලෙස අත්පත් කරගත් දේපළවල වටිනාකම මෙන් තුන් ගුණයක වටිනාමක් සහිත අනිවාර්ය දණ්ඩනයක් හඳුන්වා දෙන අතර, 2023 වර්ෂයෙන් පසු බඳවා ගත් ඇතැම් කොමිෂන් සභා කාර්ය මණ්ඩල සාමාජිකයකයන්ගේ සේවා කොන්දේසි ආරක්ෂා කරයි.

## IV. තෝරාගත් අමාත්‍ය මණ්ඩල තීරණ

### මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන

- මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායේ ප්‍රමිතීන්ට අනුකූලව සිදුකරන ලද මූල්‍ය බුද්ධි ඒකකයේ තුන්වන ජාතික අවදානම ඇගයීම (2024/25) පදනම් කරගෙන සකස් කරන ලද "මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මූල්‍යනය මැඩපැවැත්වීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය 2026-2030" ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 13)
- සුළු හා මධ්‍ය පරිමාණ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ට සහාය දීම සඳහා ජාලක-පාදක පියැසිමත සවිකළ සූර්ය බලශක්ති සහ අතථ්‍ය ශුද්ධ මනුකරණය පිළිබඳ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ණය සහ ප්‍රදාන ගිවිසුම් අනුමැතිය ලබා දෙන ලදී.: එ.ජ.ඩො.මි. 35 (ආසියානු සංවර්ධන බැංකුවේ සහනදායී සම්පත්), යුරෝ මිලියන 15.4 (යුරෝපා සංගමයේ ප්‍රදානය) සහ එ.ජ.ඩො.මි. 5.5 (ඒකාබද්ධ ණය යාන්ත්‍රණය සඳහා වන ජපන් අරමුදල). (2026 ජූලි 13)
- මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත යන පනත් කෙටුම්පත් දෙකෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද තීන්දු අනුව, එම පනත් කෙටුම්පත් දෙක සඳහා වන කාරක සභා අවස්ථාවේ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. මෙම සංශෝධන සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය ලැබී ඇත. (2026 ජූලි 6)
- 2026 අංක 05 සහ අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනුමත කරන ලදී: නියෝග අංක 05 මගින් ඉවතලන සහ අබලි ලෝහ සඳහා අපනයන පාලන බලපත්‍ර අනිවාර්ය කරයි; නියෝග අංක 06 මගින් පෙරගෙවීම් ආනයන කාල නියමයන් සංශෝධනය කරයි. (2026 ජූලි 6)

### ඩිජිටල් ආර්ථික

- නියාමනය නොකළ අක්වෙරළ ක්‍රිප්ටෝ මුදල් වෙත ප්‍රවේශ වීම හේතුවෙන් මතුවන මූල්‍ය අපරාධ අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, මූල්‍ය බුද්ධි ඒකකය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් යුතුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නියාමක ලෙස නම් කරමින්, අථත්‍ය වත්කම් සේවා සපයන්නන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය අනාගත නීති සම්පාදනය සඳහා වන නීති විධිවිධානවලට අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 27)
- 2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනතෙහි 2 සහ 3 වන වගන්ති, I කොටස (පුද්ගලික දත්ත සැකසීම) සහ III වන කොටස (පාලක සහ සකසන) යන වගන්ති ක්‍රියාත්මක වන දිනය 2027 ජනවාරි 1 වෙනි දින ලෙස නියම කරන ලදී. (2026 ජූලි 22 දිනැති ගැසට් නිවේදනය)

### ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන

- දැනට ක්‍රියාත්මක වන මාකුඹුර සහ කඩවත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන සහ ඉදිකරමින් පවතින අනුරාධපුර (දක්ෂිණ) සහ මහනුවර මධ්‍යස්ථාන ඇතුළු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම භාණ්ඩාගාරය සතු සීමාසහිත (පොදු) සමාගමක් ස්ථාපනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 27)
- 2026 වර්ෂයේ රජයේ ආයෝජන වැඩසටහන යටතේ දැනටමත් වෙන් කර ඇති රු.මි. 14,400 ක ප්‍රතිපාදනය තුළ, නගරාන්තර සහ දිගු දුර ශ්‍රී ලංගම බස්රථ සේවා සඳහා සුඛෝපභෝගී Deluxe මාදිලියේ වායු සමනය කරන ලද බස් රථ 600 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 20)
- දැනට පළාත් සභාවල හෝ පළාත් පාලන ආයතනවල අයිතිය යටතේ පවතින, හදිසි අවධානය යොමුකිරීම අවශ්‍ය කරන මාර්ග 60 ක් පුනරුත්ථාපනය කිරීම නිර්දේශ කිරීම සඳහා මුදල්, ප්‍රවාහන සහ රාජ්‍ය පරිපාලන යන අමාත්‍යාංශ, මුදල් කොමිෂන් සභාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය නියෝජනය කරන නියෝජිතයන් ඇතුළත් බහු ආයතනික කමිටුවක් ස්ථාපනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 20)
- අධික තරඟකාරිත්වය, කාලසටහනට අනුකූලවීම දුර්වල වීම, අනාරක්ෂිත ලෙස ධාවනය කිරීම සහ රථවාහන තදබදය විසඳීම සඳහා අංක 170, 177 සහ 190 දරන මාර්ගවල ඒකාබද්ධ කළමනාකරණය යටතේ පොකුරු බස් සේවා ක්‍රියාත්මක කිරීමේ නියමු වැඩසටහන අනුමත කරන ලදී. (2026 ජූලි 6)
- මහා භාණ්ඩාගාරයේ අරමුදල් සැපයීම මත අඟුලාන සයුරුපුර සහ බොරැල්ල සහස්පුර/සිංහපුර අදියර I සහ II නාගරික නිවාස සංකීර්ණ අළුත්වැඩියා කිරීම (2026-2027) සඳහා රු.මි. 764.09 ක් ලබා දීමට අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 27)

## වරාය සහ සිවිල් ගුවන් සේවා

- පරීක්ෂා කිරීමේ කවුළු 36 ක් සහ මගී පර්යන්තයේ සිට ගුවන් යානා වෙත පිවිසීමේ දොරටු 6 ක් සහිත නව ගොඩනැගිල්ලක් ඇතුළත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීමේ පර්යන්ත පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුව එ.ජ.ඩො.මි.7.26 ක සහ රු.බි. 3.77 ක (එකතු කළ අගය මත බදු හැර) මුදලකට M/s Maga Engineering (Pvt) Ltd වෙත ලබා දීම අනුමත කරන ලදී. (2026 ජූලි 13)
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වසර 5 ක කාලයකට ටොන් 70 ක බොලාර්ඩ් පුල් ටග් යාත්‍රා දෙකක් කල්බදු ක්‍රමයට ලබාගැනීමේ කොන්ත්‍රාත්තුව ජාත්‍යන්තර තරඟකාරී ලංසු තුනක් අතරින් තෝරාගත් අවම සතුටුදායක ලංසුකරු වන M/S Sri Lanka Shipping Company Ltd. වෙත එ.ජ.ඩො.මි. 17.16 ක (බදු හැර) මුදලකට ප්‍රදානය කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 20)

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන

- ආසන්න වශයෙන් රු.මි. 2,805.26 ක පුරෝකථනය කළ ආයෝජනයක් සහිත සහ ආසන්න වශයෙන් සෘජු රැකියා 870 ක් නිර්මාණය කරන, ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව සහ ව්‍යාපෘති ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද නව කර්මාන්තවල නියැළී සිටින ආයෝජකයින් 23 දෙනෙකු සඳහා ප්‍රාදේශීය කාර්මික ජනපද 13 ක ඉඩම් අවුරුදු 35 ක කාලයකට බදු දීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 27)
- 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ, එකම කාර්යයන් අතිපිහිතවීම ඉවත් කරමින්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පර්යේෂණ හා පුහුණු අංශය ලෙස මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය එම අධිකාරියට ඒකාබද්ධ කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 27)
- 2027 ජනවාරි 14-17 යන දිනවල පැවැත්වීමට නියමිත 'ශ්‍රී ලංකා එක්ස්පෝ 2027' ජාත්‍යන්තර ප්‍රදර්ශනය කළමනාකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව LECS-ASTL හවුල්කාරිත්වය වෙත රු.මි. 178.71 ක (වැට් බදු ඇතුළුව) මුදලකට ප්‍රදානය කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 6)
- මාතර සහ ගාල්ල ප්‍රදේශවල කුඩා පරිමාණ කුරුඳු වගාකරුවන්ගේ ඉහළ සැකසුම් පිරිවැය, සනීපාරක්ෂක ප්‍රමිතීන් සහ ජෛව ස්කන්ධ අපද්‍රව්‍ය ගැටළු ආමන්ත්‍රණය කිරීම පිණිස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, කාර්මික තාක්ෂණ ආයතනය සහ රුහුණු විශ්ව විද්‍යාලය (මාපලාන කෘෂි පීඨය) ඒකාබද්ධව ක්‍රියාත්මක කරන 'මධ්‍යගත ජෛව ස්කන්ධ අපද්‍රව්‍ය ශුන්‍ය කුරුඳු සැකසුම් මධ්‍යස්ථානයක්' ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 13)

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන

- රුපියල අවප්‍රමාණය වීමෙන් මුල් ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම නිසා, උසස් පෙළ (2024) විභාගයෙන් ඉහළම ප්‍රතිඵල ලබාගත් සිසුන් සඳහා ලබාදෙන ලද විදේශ ශිෂ්‍යත්ව ප්‍රදානයේ දැනට පවතින රු.මි. 20 ක වාර්ෂික ප්‍රදානයට එකතු කිරීමක් ලෙස වසරකට රු.මි. 2.5 ක් දක්වා වූ විනිමය අනුපාත ගැළපීම් දීමනාවක් ලබාදීම අනුමත කරන ලදී; මේ සඳහා සිසුන් 30 දෙනෙකු තෝරාගෙන ඇති අතර, 9 දෙනෙක් දැනටමත් විදේශගතව සිටිති. (2026 ජූලි 27)
- 2013 වර්ෂයේ දී ජාතික ව්‍යාපාර කළමනාකරණ පාසල ස්ථාපනය කිරීමේදී ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය සතුව තිබී පවරා දෙන ලද උපාධි ප්‍රදානය කිරීමේ බලතල නැවත ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන වෙත පවරා දීම සඳහා 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතන පනත සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 27)

## සෞඛ්‍ය සහ ජනමාධ්‍ය

- කළුතර, මහනුවර, නුවරඑළිය, මාතලේ, ගාල්ල, කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි, ඉතිරිවී තිබෙන එ.ජ.ඩො. 50,320 ක ප්‍රදාන ශේෂය භාවිතා කරමින් අධි රුධිර පීඩනය සහ දියවැඩියාව කළමනාකරණ කිරීම පිළිබඳ ව්‍යාපෘතිය 2027 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 20)
- විමර්ශන කමිටුවක නිර්දේශ පදනම් කරගෙන, නුවරඑළිය මූලික රෝහලේ දී බලපෑමට ලක් වූ රෝගීන් 17 දෙනෙකුට කලින් වන්දි ලබා දුන් ආකාරයට අනුකූලවන පරිදි, එම රෝහල හැර අනෙකුත් රෝහල්වල අක්ෂි සැත්කම්වලින් පසු පෙනීම අහිමි වූ තවත් රෝගීන් හතර දෙනෙකු සඳහා රු.මි. 1.0 බැගින් වන්දි ලබා දීම අනුමත කරන ලදී. (2026 ජූලි 6)

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග

- පුද්ගලික අංශයේ ප්‍රමුඛත්වයෙන් සිදුකරන සංවර්ධනය, වෙළඳපොළ-ඉලක්ක කරගත් නිෂ්පාදනය, තිරසාරත්වය, කුඩා ගොවීන්ට සහාය දීම සහ විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් සංවර්ධනය ඇතුළත් වන පරිදි යාවත්කාලීන කරන ලද ජාතික පශු සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 13)
- බංග්ලාදේශය, ඉන්දියාව, මියන්මාරය, භූතානය, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය එකට එක් කරමින්, 2027 මාර්තු 17-18 යන දිනවල දී 4 වන බිම්ස්ටෙක් කෘෂිකර්ම අමාත්‍යවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය සපයා දීම අනුමත කරන ලදී. (2026 ජූලි 13)
- 'බිම් සවිය' හිමිකම් ලියාපදිංචි කිරීමේ ජාතික වැඩසටහන මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ඉඩම් තොරතුරු පද්ධතිය සමග ඒකාබද්ධ කිරීම ඇතුළුව 'බිම් සවිය' හිමිකම් ලියාපදිංචි කිරීමේ ජාතික වැඩසටහන යටතේ හඳුනාගත් ක්‍රියාත්මක කිරීමේ ගැටළු විසඳීම සඳහා 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 20)

## පරිසර

- රටවල් 11 ක් නියෝජනය කරමින් ආසන්න වශයෙන් නියෝජිතයන් 120 දෙනෙක් සහභාගී වනු ඇතැයි අපේක්ෂා කරන 'හරිත දේශගුණ අරමුදලේ නැගෙනහිර සහ දකුණු ආසියානු කලාපීය සංවාදය' 2026 සැප්තැම්බර් 14-17 යන දිනවල කොළඹ දී පැවැත්වීම සඳහා සත්කාරකත්වය සපයා දීමට අනුමැතිය ලබා දෙන ලදී. හරිත දේශගුණ අරමුදලේ ආසියා-පැසිෆික් කණ්ඩායම මෙම සංවාදයට සත්කාරකත්වය ලබා දෙන ලෙස ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටියේය. (2026 ජූලි 27)

- 2024 වර්ෂයේ සිදුකරන ලද සංගණනයට අනුව, ආසන්න වශයෙන් වන අලි 7,450 ක් සම්බන්ධ වන, මෙරට දිස්ත්‍රික්ක 25 න් 19 ක් බලපෑමට ලක්වන, උත්සන්න වෙමින් පවතින අලි-මිනිස් ගැටුමට ප්‍රතිචාර වශයෙන්, 2020 සැලැස්ම යාවත්කාලීන කරමින්, අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා නව ජාතික ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 මැයි 15)

## බලශක්ති

- පුනර්ජනනීය බලශක්ති අධිකාරිය සමග එක්ව අධීක්ෂණය කරනු ලබන, දේශගුණයට ඔරොත්තු දෙන සහ බලශක්ති පිරිමැසුම්දායී ගොඩනැගිලි සඳහා වන ප්‍රතිපත්ති සහ ආයතනික ධාරිතාව ගොඩනැගීම සඳහා ත්‍රෛපාර්ශවික ගිවිසුමක් යටතේ GIZ (ජර්මනිය) සංවිධාන විසින් ලබා දෙන යුරෝ 924,063 ක (ආසන්න වශයෙන් රු. මිලියන 314 ක) ප්‍රදානය සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 13)

## ධීවර, ජලජ සහ සාගර සම්පත්

- ශ්‍රී ලාංකික ධීවර ප්‍රජාවේ සාමාජිකයින් 315,000 ට අධික පිරිසක් සඳහා ජාත්‍යන්තරව පිළිගත් සේවා නියුක්ති කොන්දේසි, සෞඛ්‍ය සහ වෛද්‍ය ආරක්ෂණ ප්‍රමිතීන් හඳුන්වා දීම සඳහා, කාලයත් සමග පියවරෙන් පියවර ක්‍රියාත්මක කිරීමට නියමිත, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ධීවර කර්මාන්තයේ සේවා නියුක්තිය පිළිබඳ සම්මුතිය (C188) හඳුන්වාදීම අනුමත කරන ලදී. (2026 ජූලි 20)
- නීති විරෝධී, වාර්තා නොවන සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීම් සහ ජාවාරම් මැඩ පැවැත්වීම සඳහා සහ ඉන්දියානු සාගර ටූනා කොමිසමේ නියමයන්ට අනුකූලවීමේ බැඳීම් ආමන්ත්‍රණය කිරීම සඳහා, රජයේ අරමුදල් සැපයීම යටතේ, 2021 ජනවාරි 1 වන දිනට පෙර ලියාපදිංචි කරන ලද, ආසන්න වශයෙන් පැරණි බහු-දින සහ එක්දින ධීවර යාත්‍රා 1,500 ක් සඳහා අනිවාර්ය යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය පුළුල් කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 6)

## අධිකරණ සහ ජාතික ඒකබද්ධතා

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 146 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, ප්‍රාදේශීයව පවතින ඉහළ නඩු සංඛ්‍යාව විභාග කිරීම පිණිස අභියාචනාධිකරණ සහ මහාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා සහ විනිශ්චයකාරවරුන්ගේ ව්‍යවස්ථාපිත විශ්‍රාම ගැන්වීමේ වයස ඉහළ නැංවීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතට සංශෝධන කෙටුම්පත් සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමට අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 27)
- අත්අඩංගුවට ගනු ලබන මත්ද්‍රව්‍ය නඩු විභාගය පැවැත්වීමට පෙර බැහැර කිරීම සඳහා සහ මුහුදේදී සිදුකරනු ලබන මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි විසඳීම සඳහා ඉඩ සැලසෙන පරිදි විධිවිධාන සංශෝධනය කරමින් සකස් කරන ලද විෂවර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත සංශෝධන පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 27)
- සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි අධිකරණපාත්‍රතාව සහිතව, බන්ධනාගාර ආඥා පනත (54 වන අධිකාරය) යටතේ පැරණි බෝගම්බර බන්ධනාගාරය සහ පැරණි මහමෝදර රෝහල බන්ධනාගාර ලෙස ස්ථාපනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 7-8 දිනැති ගැසට් නිවේදන)

## නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන

- ජල සැපයුම් සහ අපජල අංශවල නවීකරණයට සහාය වීම පිණිස, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තාක්ෂණික දැනුම, පර්යේෂණ ධාරිතාව සහ කාර්ය මණ්ඩල සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ RMIT විශ්වවිද්‍යාලය (ඕස්ට්‍රේලියාව) අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 20)
- පේරාදෙණිය විශ්ව විද්‍යාලය ද ඇතුළත් කිරීම පිණිස, රු.මි. 2,000 ක (රු.මි. 800 ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ ණය සහ රු.මි. 1,200 දේශීය අරමුදල්) ඇස්තමේන්තුගත පිරිවැයකින් මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය පුළුල් කිරීම සහ එය 2027 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 6)

## ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ

- සමාජ සේවා දෙපාර්තමේන්තුව, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සහ ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය යන ආයතන තුන සඳහාම දැනටමත් පොදුවේ කාර්යයන් ඉටු කරන ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් නියෝජනය වන, ඒකාබද්ධ පරිපාලන ව්‍යුහයක් යටතේ එම ආයතන තුනෙහි පරිපාලනය ඒකාබද්ධ කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 27)
- සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් පරිපාලනය කරනු ලබන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා සුදුසුකම් ලබන ඉලක්කගත කණ්ඩායම්, දැනට සිටින ධීවර හා ගොවි ප්‍රජාවන්ගෙන් ඔබ්බට පුළුල් කිරීම සඳහා 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 20)

## මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු

- වර්ධනය වෙමින් පවතින මත්ද්‍රව්‍ය ගැටලුවට ප්‍රතිචාර වශයෙන්, අන්තරාදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයේ කාර්යභාරය සහ බලතල පුළුල් කිරීම පිණිස ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සහ පනත නැවත කෙටුම්පත් කිරීම සඳහා 1984 අංක 11 දරන අන්තරාදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත සංශෝධනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 20)
- පළමු වරට මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් සඳහා ඇතුළුව, විධිමත් ප්‍රතිකාර සහ පුනරුත්ථාපන යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම පිණිස ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සහ නැවත කෙටුම්පත් කිරීම සඳහා 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් (ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය කිරීම අනුමත කරන ලදී. (2026 ජූලි 20)

## විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක

- සංක්‍රමණික සේවකයන්ගේ සුභසාධනය සඳහා වන නෛතික සහ ආයතනික රාමුව නවීකරණය කිරීම පිණිස සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම පිණිස 1985 අංක 21 දරන විදේශ සේවානියුක්ති කාර්යාංශය පනත අහෝසි කරමින් නව පනතක් කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමට අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 20)
- දැනට භාවිතයට නොගන්නා පහසුකම් වලින් ආර්ථික වටිනාකමක් උත්පාදනය කිරීම පිණිස, බෙන්තොට, කතරගම, මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරය යන ප්‍රදේශවල තිබෙන ජනාධිපති මන්දිර යෝජනා කැඳවීම් හරහා සංචාරක ව්‍යාපෘති සඳහා ආයෝජකයින්ට දිගුකාලීන බදු පදනම මත ලබා දීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 27)
- ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ උත්සව සංචාරක බුද්ධිමය දේපළ ධාරිතා ව්‍යාපෘතියට සම්බන්ධ කිරීම සඳහා මහනුවර ඇසළ පෙරහැර ආශ්‍රිත සාම්ප්‍රදායික කලා, දැනුම, ප්‍රකාශන අයිතිවාසිකම්, වෙළඳ ලකුණු සහ වෙළඳ නාම ආවරණය කරමින් මහනුවර ඇසල පෙරහැරේ බුද්ධිමය දේපළ ආරක්ෂාව සම්බන්ධ යෝජනාවක් සකස් කිරීම සඳහා ඒකාබද්ධ කමිටුවක් පත්කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 20)

## විද්‍යා හා තාක්ෂණ

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වෘත්තිකයන්ට අනෙකුත් වෘත්තීය ආයතනවලින් ලබාදෙන වරලත් තත්ත්වයට සමාන විධිමත් වරලත් තත්ත්වයක් ලබා දීමේ අරමුණින් දැනට පවතින 1976 ශ්‍රී ලංකා පරිගණක සංගමය පදනම්කර ගනිමින් නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලබන නව පනත් කෙටුම්පතක් හරහා ශ්‍රී ලංකා වරලත් පරිගණක ආයතනය සංස්ථාපනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (2026 ජූලි 20)

---

*වියාචනය - නීතිය හා සමාජ භාරය විසින් පවරන ලද පරිදි අර්මිසා ටෙගල්ගේ නිල කාර්යාලය විසින් සකස් කරන ලද මෙම ලියවිල්ල කෙටි සාරාංශයක් පමණි. මෙහි කිසිදු නෛතික විශ්ලේෂණයක් අඩංගු නොවන බැවින්, නීති උපදෙස් ලෙස මෙය කෙරෙහි විශ්වාසය නොතැබිය යුතුය.* tegal.lawchambers@gmail.com